VERITÉ RESEARCH

NO. 5 POLICE PARK PLACE,
COLOMBO 00500, SRI LANKA
TEL: + 94 718 834945; FAX: +94 719379567

# සාමයෙහි කඩතුරාවට වැසුනු ආර්ථික වෘද්ධිය ගැටළුකාරී ගමන්මගක

රටක ආර්ථික සෞභාග්‍යය මැනීමට යොදා ගන්නා ප්‍රධාන මිනුම් දණ්ඩ දළ දේශීය නිෂ්පාදිතයෙහි වාර්ෂික වර්ධන අනුපාතයයි. 2009 යුධ ජයග්‍රහණයත් සමග ඇතිවූ සාමකාමී වාතාවරණය 2010 හා 2011 තුළ ධනාත්මක ආර්ථික වෘද්ධියක් අත්පත් කරගැනීමට විශාල පිටුවහලක් විය. පශ්චාත් යුධ සමයේ ආර්ථික වෘද්ධිය දෙස විමර්ශනාත්මකව බැලීමේදී පෙනී යන්නේ 2010 හා 2011 වසර තුළ ළඟාකරගත් ඉහළ ආර්ථික වෘද්ධිය දළ දේශීය නිෂ්පාදිතයේ තිරසාර වර්ධනයක් නොවූ බවත්, වර්තමානය වන විට ආර්ථික වර්ධනය ගැටළුකාරී මාවතකට අවතීර්ණ වී ඇති බවත්ය.

දළ දේශීය නිෂ්පාදිතය යනු "යම් නිශ්චිත කාලයක් තුළ ආර්ථිකයක් තුළ නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවාවල වටිනාකමයි." මේ අර්ථයෙන් ගත් කළ විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන මුත්, ශ්‍රී ලංකාව තුළ රැකියාවල නියුක්ති වී සිටින විදේශිකයින්ගේ දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයට අන්තර්ගත වේ.

2009 දී යුද්ධය නිමාවට පෙර ගෙවුණු අවුරුදු 5 ක කාලසීමාව තුළ, එනම් 2003 - 2008 කාලච්ඡේදයේදී ශ්‍රී ලංකා ආර්ථිකය 6.34% ක සාමාන්‍ය වර්ධන වේගයක් පවත්වාගෙන යන ලදි. යුද්ධය නිමාවීමත් සමගම ගෙවුණු වසර 02 ක ශ්‍රී ලංකාව ආර්ථික වර්ධනය සම්බන්ධව සුවිශේෂී කඩඉමක් වූ 8%කට ඉහළ (2010 දී 8.02% හා 2011 දී 8.25% වශයෙන්) වර්ධන වේගයක් පවත්වාගෙන යෑමට සමත්විය. 2012 දී වර්ධන වේගය මන්දගාමී මුහුණුවරක් ගත් අතර, එම වසරේදී වාර්තා කළ 6.41% වර්ධනය, 2003 - 2008 කාලච්ඡේදයේදී වර්ධන සාමාන්‍යයට සමාන විය. මෙම කරුණු දෙස බැලීමෙන් අපට අනාගතය පිළිබඳ ලබාගත හැකි නිගමනයන් මොනවාද?

පසුගිය දශකය තුළ ආර්ථික වෘද්ධිය සම්බන්ධව වැදගත් කාලච්ඡේද 02 ක් වන 2003 - 2008 ට සාපේක්ෂව 2010 - 2011 සහ 2012 යන කාල පරාසයන් තුළ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතියෙහි සිදුවූ වෙනස රූපසටහන 01 මගින් දක්වා ඇත.

- මෙහි සඳහන් කොට ඇති යම්කිසි අංශයක වර්ධන වේගය යුධ සමයට (2003 - 2008) සාපේක්ෂව පශ්චාත් යුධ සමය වන 2010 - 2011 හෝ 2012 කාල පරාසය තුළ ඉහළ අගයක් (පහළ අගයක්) ගත්තේ නම්, රූප සටහනින් දක්වා ඇති රතු පැහැති තිරස් ස්ථම්භය ප්‍රස්තාරයෙහි දකුණු පසින් (වම් පසින්) ධන අගයක් (ඍණ අගයක්) වාර්තා කරනු ඇත.

- එමෙන්ම යම්කිසි අංශයක වර්ධන වේගය යුධ සමයට (2003 - 2008) සාපේක්ෂව පශ්චාත් යුධ සමය වන 2010 - 2011 හෝ 2012 කාල පරාසය තුළ පහළ අගයක් ගත්තේ නම්, රූප සටහනින් දක්වා ඇති නිල් පැහැති තිරස් ස්ථම්භය ප්‍රස්තාරයෙහි වම් පසින් ඍණ අගයක් වාර්තා කරනු ඇත.

- මෙහි දක්වා ඇති රතු පැහැති සහ නිල් පැහැති තිරස් ස්ථම්භයන් එකම රටාවන් දක්වා ඇත්නම්, ඉන් ගම්‍ය වන්නේ 2010-2011 කාලයෙහි සහ, 2012 තුළ ආර්ථික වර්ධනයෙහි ප්‍රධාන මූලාශ්‍රයන් සමාන බවයි.

## වෙළඳ හිඟයෙහි ප්‍රසාරණය මත පදනම් වූ 2010-2011 ආර්ථික වර්ධනය

2010-2011 කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන අංශ 03 ක් දායකත්වය සැපයීය. එනම් 1) ආනයන වෙළඳාම, 2) ප්‍රවාහනය සහ 3) ඉදිකිරීම් යන අංශයන්ය. 2003 - 2008 කාලයට 2010-2011 යන කාල පරාසය තුල සිදුවූ සමස්ත ආර්ථික වර්ධනයෙන් අඩකට පමණ දායකත්වය ලබාදුන්නේ ආනයන වෙළඳාම සහ ප්‍රවාහනය යන අංශ දෙකයි.

ආනයන වෙළඳාම යනු ශ්‍රී ලංකාවට සිදුකරන ආනයන භාණ්ඩ දේශීය වෙළඳපොළ තුළ විකිණීමේ ක්‍රියාවලිය තුළ දළ දේශීය නිෂ්පාදිතයට එකතු වන වටිනාකමයි. ආනයන භාණ්ඩ නිෂ්පාදනය විදේශීය රටක

සිදුවන බැවින් එම භාණ්ඩ වල ආනයන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් නොවේ. ප්‍රවාහන අංශයද මේ ආකාරයෙන්ම ආනයන පරිමාව ඉහළ දැමීම තුළින් වර්ධනය කළ හැක. මින් පැහැදිලි වන්නේ ආනයන වෙළඳාම සහ ප්‍රවාහනය යන අංශ දෙකෙහිම වර්ධනය ආනයන පරිමාවෙහි වර්ධනය මත පදනම් වන බවයි.

විශේෂයෙන්ම 2010-2011 කාල වකවානුව තුළ යුද්ධය නිමාවීමත් සමග සිදුවූ පාරිභෝගික උද්යෝගය, ආනයන බදු පහත දැමීම, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ පාලිත විනිමය අනුපාතය යන කරුණු සියල්ල ආනයනවල විශාල වර්ධනයක් සිදුකිරීමට හේතු විය. 2010 හා 2011 යන වසර 02 තුළ ආනයන වර්ධන වේගය පිළිවෙලින් 32% ක් හා 51% වැනි ඉතා ඉහළ අගයන් ගන්නා ලදී. මෙම කාල වකවානුව තුළ අපනයන වර්ධනය ඉතා මන්දගාමී වූ අතර, මෙම හේතුව නිසාම 2011 අවසාන වන විට ශ්‍රී ලංකාවේ වෙළඳ පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් 16.4% ක් වැනි ඉතා ඉහළ අගයක් ගන්නා ලදී. (වෙළඳ පරතරය යනු ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමෙහි අපනයන හා ආනයන වටිනාම අතර වෙනසයි).

ආනයන මත දිවෙන ආර්ථික වර්ධනය කෙටි කාලීනය.

වෙළඳ හිඟයේ ප්‍රසාරණය තුළින් සාර්ව ආර්ථික සමතුලිතයට ඉතා ප්‍රබල බලපෑම් එල්ල වේ. 2011 අවසාන වන විට වෙළඳ හිඟයේ සිදුවූ ප්‍රබල ප්‍රසාරණය මහ බැංකුවේ විදේශ වෙළඳ අනුපාතිකය පාලනය කිරීමට ඇති හැකියාව ප්‍රබල අභියෝගයකට ලක් කරන ලදී. මේ අනුව 2011 අග භාගයේදී සහ 2012 මුල් කාර්තුව තුළ රුපියල ඉතා විශාල අගයකින් අවප්‍රමාණය වීමට ඉඩ සැලසීමට මහ බැංකුවට සිදුවිය.

මීට අමතරව 2012 මුල් කාර්තුවේ සිට වෙළඳ ශේෂයේ ප්‍රසාරණය අවම කිරීම සඳහා නව බදු අනුපාත සහ රෙගුලාසි රාශියක් ඉතා අඩු කාල පරාසයක් තුළ කඩිමුඩියේ ඉදිරිපත් කරන ලදී. මේ අනුව 2012 අවසාන වන විට ආනයන 11% කින් පමණ පහත වැටුණු අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස ආනයන වෙළඳාම සහ ප්‍රවාහනය යන අංශ දෙක දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට ලබාදුන් දායකත්ය ඉතා ප්‍රබල පසුබෑමකට ලක්විය.

වෙළඳ හිඟයේ ප්‍රසාරණය තුළින් ළඟා කරගන්නා ආර්ථික වර්ධනය කෙටි කාලීන මෙන්ම තිරසාර නොවන බව න්‍යායාත්මකව දක්වා ඇත. 2010-2011 කාලය තුළ ශ්‍රී ලාංකික ආර්ථිකයේ වර්ධනය මීට කදිම ප්‍රායෝගික නිදසුනකි.

2012 ආර්ථික වර්ධනය සහ අයවැය හිඟය මත පීඩනය.

පශ්චාත් යුධ සමයේ ගෙවුණු මුල් වසර 02 තුළ සිදුවූ ඉහළ ආර්ථික වර්ධනය වෙළඳ හිඟයේ ප්‍රසාරණය තුළින් ළඟා කරගැනීමේ ප්‍රතිවිපාක ආර්ථිකයට ඉතා තදින් බලපාන ලදී. 2012 දී ආර්ථික වර්ධන දිශානතියේ පැහැදිලි වෙනසක් සිදු කරමින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2012 දී ආර්ථික වර්ධන වේගය (දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය) 6.4% ක පමණ අගයක් ගත් අතර, ඉන් 1/4 කට පමණ දායකත්වය සැපයුවේ රාජ්‍ය අංශය ප්‍රමුඛ ඉදිකිරීම් ක්ෂේත්‍රයයි. මෙහිදී මුහුණ දීමට සිදුවන ප්‍රධාන ගැටලුව නම් රාජ්‍ය අංශය මගින් සිදුකරන ඉදිකිරීම් කටයුතු සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර මගින් ණය ලබාගැනීමට සිදුවීමයි.

රාජ්‍ය වියදම වැඩි කිරීම මගින් ළඟා කරගන්නා ආර්ථික වර්ධනය තිරසාර නොවේ.

පසුගිය වසර කිහිපය මුළුල්ලේම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම විශාල පසුබෑමකට ලක්වී ඇත. මෙවැනි වාතාවරණයක් තුළ රාජ්‍ය වියදම විශාල ලෙස වර්ධනය වීමේදී එය අයවැය හිඟයට ප්‍රධාන බලපෑම් 02 ක් එල්ල කරයි. පළමුව, අයවැය හිඟය ප්‍රසාරණයට (වැඩිවීම) මෙය හේතුකාරක වේ. දෙවනුව, රාජ්‍ය ණය ඉහළ යෑමට සාධක වේ. මෙම කරුණු දෙක ශ්‍රී ලංකා ආර්ථිකය මත බාහිර ලෝකය තබන විශ්වාසය හීන වීමටත් එම නිසාම විදේශ සෘජු ආයෝජන රට තුළට ගලාඒමේ සීඝ්‍රතාවය හීන වීමටත් හේතු විය හැක.

මෙමගින් අයවැය හිඟය මත සිදුවන පීඩනය ණය ආපසු ගෙවීම පමාකිරීම වැනි කෙටි කාලීන උපක්‍රම යෙදීමෙන් යම්තාක් දුරකට සමනය කරගත හැක. එනමුත් එය ඉදිරි වර්ෂයේ අයවැය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරන අතර, 2013 රජය එවැනි පීඩනයකින් පසුවන බවට සාධක දක්නට ලැබේ. 2013 දී රජය විසින් ගත් උද්ධමනකාරී හා ජනප්‍රිය නොවන ක්‍රියාමාර්ග මීට ප්‍රබල උදාහරණ ලෙස දැක්විය හැක. 2013 දී සිදුකරන ලද විදුලි බිල ඉහල දැමීම, සුපිරි වෙළඳ සැලවල් මත පැනවූ අධික බදු වැනි ක්‍රියාමාර්ග තුළින් රජය අයවැය හිඟය මත ඇති අධික පීඩනය අවම කර ගැනීමට ක්‍රියා කරන බවක් දක්නට ඇත.

මේ අනුව පෙනී යන්නේ රාජ්‍ය වියදම ප්‍රසාරණය (ඉහළ දැමීම) තුළින් අත්පත් කරගැනීමට වෙර දරන ආර්ථික වර්ධනයද දැන් දැඩි සීමාවකට ලක්ව ඇති බවය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස දක්වන රාජ්‍ය ණය ප්‍රමාණය 2010-2011 කාලය තුළ අඩු වුවද, 2012 දී නැවත වැඩි වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවට ගලාඑන සෘජු ආයෝජන වර්ධනීය ප්‍රවනතාවයක් පෙන්නුම් කොට නොමැත (එය තවමත් ඇමෙරිකානු ඩොලර් බිලියනක සීමාව ඉක්මවා යෑමට සමත් වී නොමැත). එමෙන්ම රාජ්‍ය ආයෝජනයන්ද වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ක්ෂේත්‍ර තුළ සිදුවී නොමැති නිසා රාජ්‍ය වියදම ඉහළ දැමීම තුළින් අත්කර ගන්නා ආර්ථික වෘද්ධියද තිරසාර ලක්ෂණ පෙන්නුම් කිරීමට අපොහොසත් වී ඇත.


## අනාගතය දෙස විමර්ශනාත්මක දැක්මක්

ආර්ථික වර්ධනය සාධනීය හා තිරසාර වර්ධනයක් බවට පරිවර්තනය කරගැනීම සඳහා ඉතා කාර්යක්ෂම පරිපාලනමය ව්‍යුහයක් සහ ප්‍රතිපත්තිමය වෙනසක් අනිවාර්ය සාධක වේ. මෙම ප්‍රතිපත්තිමය වෙනස්කම් රාජ්‍ය අංශය, අධ්‍යාපනය යන ක්ෂේත්‍ර හරහා මෙන්ම අනෙකුත් රෙගුලාසිමය හා තාක්ෂණික භාවිතයන්ගේ වර්ධනය තුළින් සමස්ත ආර්ථිකයේ ආර්ථික ගනුදෙනුවල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට සමත්විය යුතුය.

කෙටිකාලීන පිළියම් වල ආයුෂ ඉතා කෙටිය. වෙළඳ හිඟය ප්‍රසාරණය තුළින් අත්පත් කරගත් ආර්ථික වෘද්ධියෙහි ආයුෂ දැනටම ගෙවී හමාරය. අයවැය හිඟය ප්‍රසාරණය මත දැනට දිවෙන ආර්ථික වෘද්ධියේ ජවය ද ඉතා වේගයෙන් හීන වෙමින් පවතී.

මෙම කරුණු දෙස ඉතා බුද්ධියෙන් විමර්ශනාත්මකව විමසා බලා රටේ අනාගතයට වඩාත් සුභදායී වන තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීමට නිසි ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට තීරණාත්මක ප්‍රවේශයක් ගැනීමට දැන් නිසි කාලය එළඹ ඇත.

රූප සටහන 01: ආර්ථික වෘද්ධියෙහි ප්‍රධාන සාධක




වෙරිටේ රිසර්ච් **(Verite Research)** යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.